# ඥානසාර හිමියන් වෙත ලබාදුන් ජනාධිපති සමාව පිළිබඳව වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

***2019 මැයි 24 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව*** - පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන් 2019 මැයි 23 වන දින බන්ධනාගාරයෙන් නිදහස් කරමින් උන්වහන්සේ වෙත ලබාදෙනු ලැබූ ජනාධිපති සමාව පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය බලවත් කම්පනය සහ කනස්සල්ල පළකොට සිටී. මෙම සමාව මගින් ජනාධිපතිවරයා සහ රජය විසින් පිළිතුරුදීමට බැඳී සිටින්නාවූ බලගතු ප්‍රශ්ණ ගණනාවක් මතු කරුණු ලැබ තිබේ.

2018 අගෝස්තු 08 වන දින අභියාචනාධිකරණය මගින් ඥානසාර හිමියන් අධිකරණයට අපහාස කිරීමේ චෝදනා හතරකට වරදකරු කරනු ලැබිණි. එහි ප්‍රතිඵලය වූයේ වසර 6ක් තුළදී ගෙවියන පරිදි වසර 19ක බරපතල වැඩ සහිත සිරදඬුවමකට ඥානසාර හිමියන් යටත් කරනු ලැබීමයි. මෙම වරදකරු කරනු ලැබීම සහ දඬුවම් නියම කරනු ලැබීම පාදක වූයේ එහිමියන් විසින් අධිකරණ පරිශ්‍රය තුළදී හැසුරුණු ආකාරය සාමාන්‍ය පුරවැසියෙකු විසින් අධිකරණය හමුවේ හැසිරිය යුතු යයි බලාපොරොත්තු වන ගෞරවාන්විත ආකාරයට ඔබ්බෙන් වූ බවට විනිශ්චය කරනු ලැබීමයි.

ජනාධිපති සමාව පවතිනුයේ යුක්තිය ඉටුකිරීමේදී අධිකරණය අසමත් වූ විටෙක එවැන්නක් නිවැරදි කිරීමට වන බව හා එසේ කිරීමේදී ද අතිශය සැලකිලිමත් බවකින් හා බැරෑරුම් බවකින් යුතුව එය ඉටුකල යුතුවන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරනය කොට සිටී.

ඥානසාර හිමියන් හට සමාවදීම කවර මිනුමකින් හෝ බලය නිසි හෝ යෝග්‍ය ආකාරයකින් භාවිත කිරීමක් සේ සැලකිය නොහැකිය. ඥානසාර හිමියන් නඩු විභාගයට ලක් කරනු ලැබීම, වරදකරු කරනු ලැබීම සහ දඬුවම් නියම කරනු ලැබීම සිදුවූ ආකාරය තුළ අධිකරණය විසින් යුක්තිය ඉටුකිරීමට අසමත්වීමක් පිළිබඳව කිසිදු සුජාත ප්‍රශ්න කිරීමකට ඉඩකඩක් නොපැවතුණු බව කිවහැකිය. එමෙන්ම එහිමියන් වරදකරු කරනු ලැබීමට එරෙහිව අභියාචනය කිරීම මගින් සාධාරණ නඩු විභාගයකට එහිමියන් හට ඇති අයිතිය පූර්ණ ලෙස භාවිත කිරීමේ සුවිශාල ඉඩකඩක් පැවති බවද පැහැදිලිය. සැබවින්ම මෙම විකල්පය එහිමියන් විසින් අභියාචනාධිකරණයේදී මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයයේදී ද භාවිත කිරීමට යෙදුනු අතර එම උත්සාහයන් දෙකම නිසි ආකාරයෙන් අභියාචනයන් ලෙස නිෂ්ප්‍රභ කරනු ලැබිනි. එබැවින් මෙම සමාවදීම ම නීති ක්‍රියාදාමය වෙත වූ අයුතු මැදිහත්වීමක් බවට පත්වේ.

මෙම සමාව මගින් බරපතල ලෙස කනස්සල්ල දනවන සුළු කරුණු ගණනාවක් ඉස්මතු කෙරේ. පළමුව එමගින්,අධිකරණයට අපහාස කොට, නිසි අධිකරණ ක්‍රියාදාමයක් ඔස්සේ දඬුවම් කරනු ලැබ, දේශපාලන සැලකීම් මත දෙනුලබන සමාවක් ඔස්සේ දන්ඩන මුක්තියක් භුක්ති විඳිය හැකිය යන අදහස සුජාතභාවයකට ලක්කෙරේ. නීතියට කීකරුවීමේදී, බෞද්ධ භික්ෂූන් වහන්සේලා වැනි ඇතැම් පුරවැසි ප්‍රභේදයන් හට වාසිදායක ලෙස වන වරණීය සැළකිල්ලක් භුක්තිවිඳීම බලාපොරොත්තු විය හැකි යැයි ද මෙම සමාව මගින් විශේෂිත ලෙස ඉඟිකෙරේ. නිසි නඩු විභාගයකට ලක්කරනු ලැබ, වැරදිකරු කරනු ලැබ, දඬුවම් නියම කරනු ලැබූ පුද්ගලයන් ජනාධිපතිවරයාගේ හෝ රජයේ සිතැඟි අනුව නිදහස් කරනු ලැබිය හැකි බවට වන භයානක පූර්වාදර්ශයක් ද එමගින් නිර්මාණය වේ.

දෙවනුව, මෙම සමාව පැමිණෙන්නේ රටේ තවමත් සිදුවෙමින් පවතින අතිශයින් හැඟීම් ඇවිලුණු ආතතිමය තත්ත්වයක් මධ්‍යයේය. ශ්‍රී ලංකවේ වයඹ පලාත පුරා අන්තවාදී සිංහල බෞද්ධ කලහකාරී පිරිස් විසින් උසිගන්වනු ලැබූ මුස්ලිම් විරෝධි කෝලාහලයන්ගෙන් පසු ගතවී ඇත්තේ සතියක් පමණි. මෙම කෝලාහලවලදී එක් පිරිමි මුස්ලිම් ජාතිකයෙකු මිය ගිය අතර මුස්ලිම් නිවාස, ව්‍යාපාර සහ පූජනීය ස්ථාන විශාල සංඛ්‍යාවකට අලාභහානි සිදුකරනු ලැබිණි. සුළුතර ප්‍රජාවන්, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව, කෙරෙහි එල්ල වූ ප්‍රචණ්ඩත්වය අවුස්සමින් වෛරී භාෂණයෙහි යෙදීම පිළිබඳව බොදු බලසේනා සංවිධානයේ ලේකම් ලෙස ඥානසාර හිමියන් ඉටුකළ භූමිකාව පිළිබඳව වාර්තාගත වී පවතී. එවැනි සුළුතර විරෝධී හැඟීම්, කනස්සල්ල දනවමින්, වක්‍ර

ලෙස හෝ අනුමත කිරීමක් මෙම සමාව මගින් නිරූපනය වේ. එමගින් සිදුවිය හැක්කේ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජනතාව අද අත්විඳින බිය සහ සාංකාව උග්‍රවීම පමණකි.

මේ අකාරයෙන් නීතියේ ආධිපත්‍යයට මැදිහත්වීම සහ සුළුතර විරෝධී හැඟීම් අනුමත කිරීම පිළිබඳව වූ වගකීම පැවරෙන්නේ ජනාධිපතිවරයාට පමණක් නොවේ. පුළුල් ලෙස ගත් කල එය මුළු රජය විසින්ම භාරගත යුතු වගකීමකි. මීට පෙර බුද්ධ ශාසන ඇමති ගාමිණී ජයවික්‍රම මහතා විසින් ආගමික හා දේශපාලන තුන්වන පාර්ශවයන් විසින් මෙම සමාව ක්‍රියාත්මක කිරීමට කරනු ලැබූ ඉල්ලීම් අනුමත කරනු ලැබිණි. එමෙන්ම රජයේ සාමාජිකයන් ගණනාවක් විසින්ම මෙම සමාවට පක්ෂව විවෘතව අදහස් දක්වා තිබුණු අතර ඊට සහයෝගීව ක්‍රියාකොට තිබිණි. මෙම නඩුව සම්බන්ධයෙන් මෙසේ සමාව ලබාදීම අන්තර් වාර්ගික ආතතීන් උග්‍ර කරවන්නක් නොවන්නේ හා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, නීතියේ ආධිපත්‍ය සහ යුක්තිය පසිඳලීම සමඟ නොගැළපෙන්නක් නොවන්නේ කෙසේදැයි ප්‍රකාශිත හේතූන් ඉදිරිපත් කරමින් සාධාරණීකරණය කිරීම මේ අනුව සමස්ත රජයම විසින් සිදුකළ යුතුව ඇත. මීට අඩු වූ ඕනෑම දෙයකින් සිදුවනු ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ සුජාතභාවය සෘජු ලෙසම අනතුරට පත්කිරීමයි.